ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ඌව පළාතේ, පළාත් සභාව

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின்
ஊவா மாகாணத்தின், மாகாண சபை

# Provincial Council of Uva Province of the Democratic Socialist Republic of Sri Lanka

ඌව පළාතේ පළාත් සභාවේ
2014 අංක 2 දරන
මුල් ළමාවිය ප්‍රඥප්තිය

ஊவா மாகாண மாகாண சபையின்
2014 ஆம் ஆண்டின் 2 இலக்கம்
ஆரம்ப பிள்ளைப் பருவ நியதிச் சட்டம்

## Pre-childhood Statute of Uva Provincial Council
## bearing No. 2 of 2014
## of the Provincial Council of the Uva Province

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014-07-01 වන දින සිට ක්‍රියාත්මක කිරීම අනුමත කර ඇත
)7-01 ஆம் திகதி முதல் நடைமுறை படுத்துவதற்கு ஊவா மாகானத்தின் கௌரவ ஆளுநர் அவர்களால் அனுமதி வழங்கப்பட்டுள்ளது
Approved by the Honourable Governor to be executed with effect from 01st July, 2014

# ඌව පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරණ මූල් ළමාවිය ප්‍රඥප්තිය

මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය

# ඌව පළාතේ පළාත් සභාවේ 2014 අංක 2... දරණ මුල් ළමාවිය ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පළාත් සභා වෙත පැවරී ඇති සීමාවන්ට යටත්ව ඌව පළාත තුළ දැනට පවත්වාගෙන යනු ලබන හෝ මතුවට ආරම්භ කරනු ලබනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල්, මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන හෝ වයස අවුරුදු පහට අඩු දරුවන්ගේ ශාරීරික හෝ මානසික සංවර්ධනය හෝ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අරමුණ ඇතිව පවත්වා ගෙන යනු ලබන මධ්‍යස්ථාන ලියා පදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය කිරීම හා මෙහෙයවීම සඳහා ද ඊට අනුශාංගික කාරණා සඳහා වූ විධිවිධාන සැලැස්වීම සඳහාද වූ ප්‍රඥප්තියකි.

ඌව පළාත් සභාව 2011 අංක 05 දරණ ඌව පළාතේ මුල් ළමාවිය ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද විධිවිධාන සලසනු ලබන ප්‍රඥප්තිය කි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය 2014 අංක .2... දරන ඌව පළාතේ මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙහි මින්මතු "ආණ්ඩුකාරවරයා" ලෙස හඳුන්වනු ලබන ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන දිනක සිට ක්‍රියාත්මක වේ. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

## 1 කොටස

2. දරුවෙකුගේ මුල් ළමාවිය වශයෙන් සැලකෙන වයස අවුරුදු පහ සම්පූර්ණ වන තෙක් කාලසීමාව තුළ ළමාවිය සංවර්ධනය සඳහාත්, නිසිමග පෙන්වීම සඳහාත් වූ පහත සඳහන් පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා සුදුසු හා යෝග්‍ය නෛතික, ආයතනික හා පරිපාලනමය ව්‍යුහයක් ගොඩ නැගීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වන්නේය. අරමුණු

   1. ඉන්ද්‍රියයන් ඇසුරින් අත්දැකීම් ලබා ගැනීමට හැකි හිතකර, සාරවත් ආරක්ෂා සහිත පරිසරයක් ඇති කිරීම.

   2. එදිනෙදා ක්‍රියාකාරකම් තුළින් යහපත් ආචාරශීලී හැසිරීම් රටාවක් සංවිධානය කර ගැනීමට සහ ප්‍රිය මනාප කතා බහකට හුරුවීමට අවස්ථාව ලබා දීම.

   3. මනා සෞඛ්‍ය පුරුදු හුරු කිරීම හා දරුවන්ට නිසි පෝෂණය ලබාදීම.

   4. යහගුණ වගා කර ගැනීමට හිතකර පරිසරයක් සැපයීම.

5. අවුරුදු පහට අඩු දරුවන්ට නිසි අධ්‍යාපනය හා නිසි රැකවරණය ලබා දීම.

6. ළමා රැකවරණය හා ළමා අයිතීන් සුරැකීම හා නීතිය ක්‍රියාත්මක කිරීම.

7. මුල් ළමාවියේ දරුවන්ගේ මානසික හා පෞරුෂත්වය වර්ධනය කිරීම.

8. ශාරීරික වර්ධනය හා හසුරු කුසලතා සංවර්ධනයට අවස්ථා සැලසීම.

9. බුද්ධිමත් නිර්මාණශීලී හැකියා සංවර්ධනය කිරීම.

10. පරිසරයට ආදරය කිරීම හා ඒ තුළින් වින්දනයක් ලබා ගැනීමට, පරිසරය අගය කිරීමට හා පරිසරය ආරක්ෂා කිරීමට මග පෙන්වීම.

11. අභියෝගාත්මක අවස්ථාවන්ට මුහුණ දීමේ හැකියාව ලබා දීම.

12. සහජීවනයෙන් කටයුතු කිරීමට හුරු කෙරෙන සුහද වාතාවරණයක් ගොඩනැගීම.

13. දරුවාට මුල් ළමාවිය සතුටින් හා විනෝදයෙන් ගත කිරීමට ඉඩ සැලැස්වීම.

14. මෙම වයසේ ළමුන්ගේ හැකියාවන් අවදි කිරීම හා පෝෂණය කිරීම සඳහා සුදුසු පරිසරයක් ඇති කිරීම.

15. ඔවුන්ගේ ඉදිරි විධිමත් අධ්‍යාපනය උදෙසා ශක්තිමත් අත්තිවාරමක් දැමීම.

## 11 කොටස

### පරිපාලනය හා අධීක්ෂණය කිරීම.

3. (1). මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය මෙයින් පිහිටවනු ලැබේ. අධිකාරිය පිහිටුවීම

(2) අධිකාරිය (1) වන උප වගන්තියේ ඊට දී ඇති නාමයෙන් අවිච්චින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැක. අධිකාරියේ අරමුණ

(ඈ) අධිකාරියේ අරමුණ වන්නේ ඌව පළාත තුළ පූර්ව ළමා විය අධ්‍යාපනය අධීක්ෂණය හා කළමනාකරණය කිරීම තුළින් ඌව පළාතේ මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධනය කිරීම යි.

(3) අරමුණ සපුරා ගැනීම පිණිස අධිකාරිය විසින් මතු දැක්වෙන කාර්යයන් කළ හැකි ය. අධිකාරියේ කාර්යයන්

(අ) ඌව පළාතේ මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා ආධාර ලබා දීම.

(ආ) මුල් ළමා විය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම, ඒවායේ කටයුතු අධීක්ෂණය හා නියාමනය

(ඇ) මුල් ළමා විය අධ්‍යාපන ආයතන වල ශිෂ්‍යයන්ගේ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් කොන්දේසි පැනවීම.

(ඈ) මුල් ළමා විය අධ්‍යාපන ආයතන වල උපදේශක/උපදේශිකාවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් නියම කිරීම.

(ඉ) මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධන ආයතනවල උපදේශක/ උපදේශිකාවන් පුහුණු කිරීම.

(ඊ) මුල් ළමා විය අධ්‍යාපන ආයතන වල උපදේශක/ උපදේශිකාවන් පුහුණු කිරීම සඳහා ගුරු පුහුණු ආයතන පිහිටුවා පවත්වා ගෙන යාම හා නිසි පුහුණුව ලැබූ අයට සහතික පත්‍ර ලබා දීම.

(උ) මුල් ළමා විය අධ්‍යාපන නවීකරණයන්ට අදාළ සේවාස්ථ සැසි පැවැත්වීම.

(ඌ) පළාත් පාලන ආයතන ඇතුළු අවශේෂ සංවිධාන විසින් පවත්වා ගෙන යනු ලබන මුල් ළමා විය අධ්‍යාපන ආයතන වල පාලනය හා කළමණාකරණය ගැන ප්‍රමිතිය නියම කිරීම.

(එ) මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධනයේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

(ඒ) ඉහත නිශ්චිත වශයෙන්ම සඳහන් කර නැතත් ඌව පළාත තුළ මුල් ළමා විය අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(4) ස්වකීය කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි බලතල අධිකාරිය වෙත තිබිය යුතු අතර පහත සඳහන් බලතලද තිබිය යුතු ය. අධිකාරියේ බලතල

(අ) අධිකාරිය විසින් සලසනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු හෝ මුදල් අයකිරිම.

(ආ) අධිකාරියේ කාර්යය ඉටු කිරිම සඳහා මුදල් උපකරණ හා වෙනත් ආධාර ලබා දීම.

(ඇ) අධිකාරියේ නිලධරයන් හා සේවකයන් සඳහා වැඩ ඉටුකිරිමේ ප්‍රමිතින් සහ එකී ප්‍රමිතින්ට අනුකූලව ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැඩ ඉටු කිරීම, ඇගයීම සහ ඒ පිළිබඳව ක්‍රියා කිරීම.

(ඈ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරිමට අවශ්‍ය විය හැකි ගිවිසුම් වලට ඇතුළත් වීම.

(ඉ) අධිකාරියේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් රීති සැකසීම.

(ඊ) අධිකාරියේ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන හෝ ආනුශාංගික වන හෝ බලපාන වෙනත් සියලු දේ කිරීම.

(4). (අ) ආණ්ඩුකාරවරයා විසින් අධිකාරිය සඳහා නමින් හෝ නිල නාමයෙන් හෝ මෙහි මින් මතු " නිසි බලධාරියා" යනුවෙන් හඳුන්වනු ලබන තැනැත්තෙකු පත් කළ යුතුය. නිසි බලධාරියෙකු පත්කිරිම

(ආ) මෙසේ පත් කරනු ලබන්නා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හා අධ්‍යාපනය සම්බන්ධ පශ්චාත් උපාධියක් ඇති තැනැත්තෙක් විය යුතු ය.

(ඇ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් කාර්ය හා කර්තව්‍ය ඉටු කරමින් මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර දීම නිසි බලධාරියාගේ වගකීම වන්නේය. නිසි බලධාරියාගේ වගකීම

5. (අ) නිසි බලධාරියා, මෙහි මින්මතු " ලේකම්වරයා" ලෙස හඳුන්වනු ලබන ඌව පළාතේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හා මෙහි මින් මතු " අමාත්‍යවරයා " යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාතේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ විධිවිධානයන්ට යටත්ව කටයුතු කළ යුතුය. අධීක්ෂණය හා පාලනය

(ආ) නිසි බලධරයා මිය යාම, ඉල්ලා අස්වීම, ධූරයෙන් ඉවත් කරනු ලැබීම නිසා හෝ කලින් ධූරය අත්හරිනු ලැබුවොත් මිස ස්වකීය පත්වීම් දිනයේ සිට අවුරුදු 03ක් ධූරය දැරිය යුතු ය. නිසි බලධාරියාගේ සේවා කාලය

(ඇ) උපදේශක මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි බලතල කර්තව්‍ය නිසි බලධරයා විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම කළ යුතු යි.

(ඇ) 4(අ) උප වගන්තිය යටතේ පත් කරන ලද නිසි බලධාරියා අමාත්‍යවරයා විසින් හේතු දක්වමින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඉ) ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ප්‍රධාන අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චිත කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක්, තම සේවය ඉටු කිරීම වෙනුවෙන් නිසි බලධාරියාට ගෙවනු ලැබි යුතු ය.

(ඊ) මිය යාමෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ධූරය දරන තැනැත්තා විසින් තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා ලිපියක් මඟින් ඉල්ලා අස්වීමෙන් නිසි බලධාරි ධූරය හිස්වන්නේ ය.

(උ) 5(ආ) උප වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබූ තැනැත්තෙකු නොවේ නම් නිසි බලධාරියා ලෙස නැවත පත්වීම් ලැබීමට සුදුස්සෙකු විය හැකි ය.

(ඌ) නිසි බලධාරි ධූරයේ යම් පුරප්පාඩුවක් ඇති වූව හොත් 4 (අ) උප වගන්තිය යටතේ පත් කිරීම කරනු ලබන තෙක් අමාත්‍යවරයා විසින් උපදේශක කමිටුවේ සාමාජිකයෙකු එකී ධූරයේ කටයුතු කරගෙන යාම සඳහා පත් කරනු ලැබි ය හැකි ය.

නිසි බලධාරියා සතු බලතල කාර්ය හා කර්තව්‍යය

6. නිසි බලධාරියා විසින් මෙහි මින්මතු " මධ්‍යස්ථාන" යනුවෙන් හඳුන්වනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, පෙර පාසැල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ වයස අවුරුදු පහට අඩු දරුවන්ගේ ශාරීරික හෝ මානසික සුරක්ෂිතභාවය හෝ සංවර්ධනය වෙනුවෙන් ඌව පළාත තුළ පවත්වා ගෙන යනු ලබන කිසියම් මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් අදාල වන මෙහි පහත දැක්වෙන කාර්ය හා කර්තව්‍ය ද මෙම ප්‍රඥප්තියේ වෙනත් තැනක ඔහු විසින් ඉටුකළ යුතු බවට දක්වා ඇති කාර්යය හා කර්තව්‍ය ද ඉටු කළ යුතු අතර, එම කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඔහුට මෙම ප්‍රඥප්තිය මඟින් බලතල පවරා දෙනු ලැබේ.

(අ) පළාත තුළ පැවැත්වෙන මධ්‍යස්ථාන වලට යුක්ති සහගත වේලාවල් තුළදී ඇතුල්වීම, පරිශ්‍රය හා අදාළ ලිපිලේඛන පරීක්ෂා කිරීම.

(ආ) මධ්‍යස්ථාන වල ළමුන් සඳහා පොත්, ඉගැන්වීමේ ක්‍රම හා උපකරණ හඳුන්වා දීම.

(ඈ) මධ්‍යස්ථාන හිමිකරුවන්ගෙන් හෝ ඒවා පවත්වාගෙන යනු ලබන පාර්ශවයන්ගෙන් හෝ ඒ අවස්ථාවේ එහි සිටින මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු වලට සම්බන්ධ වූ ඕනෑම අයකුගෙන් ලිඛිතව හෝ වාචිකව ප්‍රශ්න කිරීම් හා පැහැදිලි කිරීම් ලබා ගැනීම, හා වාර්තා සහ තොරතුරු ලබා දෙන ලෙස නියම කිරීම.

(ඈ) යම් මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම හෝ හේතු දක්වා ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම.

(ඉ) ඕනෑම මධ්‍යස්ථානයකට අයත් ලේඛන, පොත්පත්, සටහන් වාර්තා හා ගොනු පරීක්ෂා කිරීම හා අවශ්‍ය වුවහොත් තමා භාරයට ගැනීම.

(ඊ) අවශ්‍ය සුදුසුකම් සනාථ කිරීමට අසමත් යම් මධ්‍යස්ථානයක ඉගැන්වීමේ යෙදෙන්නන්ගේ සේවය අත්හිටුවීමට හා නතර කිරීමට පියවර ගැනීම.

(උ) යම් මධ්‍යස්ථානයක ඉගෙන ගන්නා දරුවන්ට මෙම ප්‍රඥප්තියේ නියම කර ඇති අවම පහසුකම් ලබා දෙන ලෙස ඒ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ආයතනයට හෝ හිමිකරුට නියම කිරීම.

(ඌ) පවත්වනු ලබන ඕනෑම මධ්‍යස්ථානයක් පරීක්ෂණයකින් පසුව එම මධ්‍යස්ථානය මෙම ප්‍රඥප්තියේ සඳහන් විධි විධානයන්ට අනුව පවත්වාගෙන නොයන්නේ නම් එම මධ්‍යස්ථානය පවත්වාගෙන යෑම නතර කිරීම හෝ අත්හිටුවීම සඳහා කටයුතු කිරීම.

(එ) මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන සේවා පහසුකම් හා කාර්ය මණ්ඩලය ආදිය සැළකිල්ලට ගෙන ශ්‍රේණිගත කිරීම.

(ඒ) මධ්‍යස්ථාන වල උගන්වනු ලබන ගුරුවර/ගුරුවරියන්ට,කාර්ය මණ්ඩලයට පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම හා ඒවාට සහභාගී වීමට මධ්‍යස්ථාන වල ගුරුවර/ ගුරුවරියන්ට හා වෙනත් සම්බන්ධ අයවළුන්ට නියම කිරීම.

(ඓ) මධ්‍යස්ථාන වල ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවන පෞද්ගලික අධ්‍යාපන ආයතන ලියා පදිංචි කිරීම හා අවශ්‍ය විටක ඒවාට විධාන නිකුත් කිරීම.

(ඔ) මෙම ප්‍රඥප්තිය යටතේ සපයනු ලබන සේවාවන් කිසිවක් සඳහා ගාස්තු අය කිරීම.

(ඕ) මධ්‍යස්ථාන කලින් කලට අධීක්ෂණයට හා පරීක්ෂණයට ලක්කිරීම.

(ඖ) මධ්‍යස්ථානයක් විසින් පවත්වාගෙන යා යුතු පොත් පත්, ලේඛන හා ආකෘති පත්‍ර හඳුන්වාදීම හා ඒවා භාවිතා කිරීමට නියම කිරීම.

7. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් යටතේ තමා වෙත පවරා දෙනු ලබන යම් බලතල කාර්ය හා කර්තව්‍ය නිසි බලධරයා විසින් ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතුය.

8. මේ ප්‍රඥප්තිය යටතේ තමා වෙත පවරා දෙන ලද හෝ වෙන් කොට දෙන ලද බලතල කාර්ය හා කර්තව්‍ය කිසිවක් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව බලධරයා විසින් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ වෙනත් යම් නිළධාරියෙකුට පවරා දෙනු ලැබිය හැකිය. බලතල පැවරීම

## III කොටස

### ඌව පළාත් මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධන අරමුදල.

9. "ඌව පළාත් මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදල අධිකාරිය විසින් පිහිටුවිය යුතු අතර, එය ඌව පළාත් සභාවේ වෙනම ගිණුමක් වශයෙන් පවත්වා ගෙන යා යුතුය. අරමුදල

1 (අ) 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ තුන්වන කොටසේ විධිවිධාන එම අරමුදලට අදාළ විය යුතුය.

(ආ) අධිකාරිය සඳහා පළාත් සභාව විසින් වරින් වර ලබා දෙන සියළු මුදල් හා අධිකාරියේ බලතල කාර්යයන් හා රාජකාරි ඉටු කිරීමේදී අධිකාරිය විසින් ලබා ගන්නා සියළු මුදල් ද වෙනත් ආධාර හා ප්‍රධානයන් ද අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය. අරමුදල යෙදවිය යුතු කරුණු

2. අධිකාරියේ අරමුණු සපුරා ගැනීම පිණිස හෝ මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ එයට පැවරී ඇති බලතල, කාර්යයන්, රාජකාරී ක්‍රියාත්මක කිරීම ඉටු කිරීම හෝ කාර්යය සාධනය සඳහා එකී අරමුදල් උපදේශක මණ්ඩලය තීරණය කරන ආකාරයට යොදා ගත හැකිය.

3. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳවත්, වෙනත් සියලූ ගණුදෙනු පිළිබඳවත් නිසි පරිදි ගිණුම් තැබීම මණ්ඩලය විසින් සැලැස්විය යුතු අතර, අමාත්‍යවරයා විසින් පවරනු ලබන නියෝග වලින් නියම කරනු ලබන ආකාරයට හා නියම කරනු ලබන තොරතුරු ඇතුළත් කොට අධිකාරියට ආදාළව ගිණුම් හා සංඛ්‍යාලේඛන ඇතුලත් වාර්ෂික ගිණුම් ප්‍රකාශනයක් පිළියෙළ කළ යුතුය. අධිකාරියේ ගිණුම

4. අධිකාරියේ මුදල් වර්ෂය ජනවාරි මස පළමු වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ. අධිකාරියේ මුදල් වර්ෂය

අධිකාරියේ විගණනය

(1) මුදල් වර්ෂය අවසාන වී මාස 03 ක් ඉක්මවීමට පෙර අදාළ මුදල් වර්ෂය වෙනුවෙන් අධිකාරියේ ගිණුම් විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම පළාත් අධිකාරියේ ගිණුම විගණනය කරනු ලැබිය යුතුය.

(3) විගණකාධිපතිවරයා විසින් අධිකාරයේ ගිණුම පරීක්ෂා කර පහත සඳහන් කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

එනම්,

(අ) තමන්ට අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුණේද නැද්ද යන වග,

(ආ) අධිකාරියේ කටයුතු පිළිබඳව නිවැරදි හා සාධාරණ අදහස් ලබා ගැනීමට හැකි වන පරිදි වාර්තාවේ සඳහන් ගිණුම් නිසියාකාරව සකස් කර තිබේද යන වග,

(ඇ) තම අදහස්වලට අනුව පළාත් සභාවේ අවධානයට යොමු විය යුතු යම් කරුණු හෝ අධිකාරියේ කටයුතු සහ ගිණුම පිළිබඳ පරීක්ෂණයේදී හෙළි වූ වැදගත් කරුණු

5. විගණකාධිපතිවරයා විසින් ඔහුගේ වාර්තාව සමඟ විගණනය කරන ලද ගිණුම , අධිකාරියේ සභාපතිවරයා වෙත යැවිය යුතුය.

6. සභාපතිවරයා විසින් එකී විගණනය කරන ලද ගිණුම හා විගණකාධිපතිවරයාගේ වාර්තාව තමාට ලැබුණු විට එම වාර්තාවට අදාළ මුදල් වර්ෂය තුළදී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවද සමඟ එම ගිණුම් වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් එම ගිණුමට අදාළ මුදල් වර්ෂය ඉකුත් වී දොළොස් මසක් ගතවන්නට ප්‍රථම ඒවායේ පිටපත් අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය. විගණකාධිපතිවරයාගේ වාර්තාව හා අධිකාරියේ වාර්ෂික කටයුතු පිළිබඳ වාර්තාව ද ගිණුම් වාර්තාව ද ඇමතිවරයාට ඉදිරිපත් කළ යුතු බව

## IV කොටස

## මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ උපදේශක කමිටු පත් කිරීම.

10. පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත මෙහි මින්මතු "උපදේශක කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උපදේශක කමිටුවක් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතුය. උපදේශක කමිටුව පත්කිරීම

(අ) මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ උපදේශක කමිටුව සඳහා මෙහි මින්මතු නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයින්ලෙස හඳුන්වනු ලබන, සාමාජිකයින්

1. කමිටුවේ සභාපතිවරයා විය යුතු, ඌව පළාත් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් ගෙන්

2. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන්

3. ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ගෙන්

4. ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස් ගෙන්

5. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් ගෙන්

6. ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ ගෙන්

7. කමිටුවේ ලේකම් විය යුතු නිසි බලධාරියා ගෙන් සහ

(ආ) මෙහි මින්මතු නම් කරනු ලබන, සාමාජිකයින් ලෙස හඳුන්වනු ලබන;

1. ජාතික ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් නිර්දේශ කරනු ලබන නියෝජිතයෙකු,

2. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් නිර්දේශ කරනු ලබන සිංහල / දෙමළ මාධ්‍ය පෙර පාසල් ගුරුවරියන් දෙපලක්

3. බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් එකී දිස්ත්‍රික්ක දෙක නියෝජනය වන ආකාරයෙන් නිර්දේශ කරනු ලබන මුල් ළමාවිය සංවර්ධන විෂයට අදාළව කටයුතු කරන ස්වේච්ඡා සංවිධානවලට අයත් නියෝජිතයින් එක් දිස්ත්‍රික්කයකට එක් අයෙකු බැගින් දෙදෙනෙක්.

4. අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබන මුල් ළමා විය විෂය පිළිබඳ මනා පරිචයක් ඇති නියෝජිතයන් දෙදෙනෙක්.

5. නීති ක්ෂේත්‍රෙය් පළපුරුද්දක් හෝ සුදුසුකම් ඇත්තා වූ නැතහොත් ප්‍රවීනත්වය දක්වනු ලබන තැනැත්තෙක්.

වශයෙන් නම් කරනු ලබන සාමාජිකයන්ගෙන්ද සමන්විත විය යුතුය.

11. (1). නිල බලයෙන් පත් වන සාමාජිකයින් අතුරින් උපදේශක කමිටුවේ සභාපති ඌව පළාතේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විය යුතු අතර ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන නිසි බලධාරියා මෙම කමිටුවේ ලේකම් විය යුතු ය. — කමිටුවේ සභාපති හා ලේකම්

(2). උපදේශක කමිටුවේ නිල කාලය අවුරුදු තුනකට සීමා විය යුතුය. — නිල කාලය

(3). උපදේශක කමිටුවේ රැස්වීමේ ගණ පූර්ණය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. — කමිටුවේ ගණ පූරණය

(4). නම් කළ සාමාජිකයකු මියයෑමෙන් , ඉල්ලා අස්වීමෙන්,ධූරයෙන් ඉවත්කරනු ලැබීමෙන් හෝ කලින් ධූරය අත්හලහොත් මිස වසර තුනක කාලයක් ධූරය දැරිය යුතුය. — සාමාජික ධූරකාලය

(5). නම් කළ සාමාජිකයෙකු, පිළිගත හැකි හේතුවක් ලෙස උපදේශක කමිටුව විසින් සලකන යම් හේතුවක් නොමැතිව , නොදන්වා සභාවේ රැස්වීම් තුනකට පිට පිටම නොපැමිණිය හොත් එම සාමාජිකයා ධුරය අත්හැර ගිය අයෙකු ලෙස සලකනු ලැබිය යුතු අතර, කමිටුවේ ලේකම් විසින් ඒ බව ආණ්ඩුකාරවරයා වෙත දැනුම් දීමෙන් අනතුරුව ඒ සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙකු ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතුය. ධුරය අහිමිවීම

(6). ආණ්ඩුකාරවරයා විසින් ඕනෑම අවස්ථාවක උපදේශක කමිටුවේ සාමාජිකයකු ලිඛිත දැනුම් දීමක් සිදුකිරීමෙන් අනතුරුව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. ධුරයෙන් ඉවත් කිරීම

(7). නම් කළ සාමාජිකයෙකුට තමා ධුරයෙන් ඉල්ලා අස්වෙන බවට ආණ්ඩුකාරවරයා වෙත ලිඛිත දැනුම් දීමක් කළ හැකි අතර, එම ඉල්ලා අස්වීම ආණ්ඩුකාරවරයා විසින් පිළිගනු ලැබුව හොත් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය. ඉල්ලා අස්වීම

(8). සාමාජිකයෙකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස්වන අවස්ථාවක ආණ්ඩුකාරවරයා විසින් 10 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයෙකු වශයෙන් වෙනත් තැනැත්තෙකු පත් කළ යුතුය. එම සාමාජිකයා වෙනුවට පත්කරනු ලැබූ යම් අනුප්‍රාප්තිකයෙකු විසින් තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතුය.

(9) මෙම කමිටුවට සාමාජිකයෙකු ලෙස වරක් නම් කළ තැනැත්තෙකු නැවත වරක් කමිටුවේ සාමාජිකයෙකු ලෙස නම් කිරීමට හැකි විය යුතුය.

12. (1). ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්ට යටත්ව මෙම කමිටුව පවත්වාගෙන යාම සඳහා අදාල වන කරුණු සම්බන්ධයෙන් ක්‍රියා පරිපාටි උපදේශක කමිටුව විසින් සකස් කරගත යුතුය. කමිටුව පවත්වාගෙන යාම

(2). උපදේශක කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් වත් රැස්විය යුතුය. උපදේශක කමිටුවේ රැස්වීම

13. යම් තැනැත්තෙක්; කමිටු සාමාජිකත්වයට නුසුදුසුකම්

(අ). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ පුරවැසියෙකු වී සිටීම නතර වුවහොත්

හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් වී හෝ බංකොලොත්භාවයට පත් වී සිටින බවට ප්‍රකාශයට පත්කරනු ලැබ සිටිනම්

හෝ

(ඈ). ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අධිකරණයක් විසින් නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිනම් හෝ විඳ ඇත්නම්

හෝ

(ඇ). උපදේශක සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඔහු විසින් ඔහුගේ කාර්යයන් ඉටුකිරීමේදී හානිකර ලෙස බලපෑමට ඉඩ තිබෙන යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් දරණ බව ආණ්ඩුකාරවරයාගේ මතය වන්නේ නම් හෝ

(ඉ). මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබුවහොත් හෝ

උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කිරිමට හෝ කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙකු විය යුතුය.

14. කමිටුවේ කිසිදු ක්‍රියාවක්,තීරණයක් හෝ නීති කර්තව්‍යක් කමිටුවේ පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමේ දෝෂයක් තිබීම හේතුවෙන් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතුයි.

15. කමිටුවේ සාමාජිකයන්ට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව ප්‍රධාන අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් පරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය.

16. උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන කාර්යයන් හා කර්තව්‍ය ඉටු කළ යුතුය. උපදේශක කමිටුවේ කාර්ය හා කර්තව්‍ය

(අ) මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයේ ප්‍රමිතිය නංවාලීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හා සහාය ලබාදීම.

(ආ) මධ්‍යස්ථාන සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අදාළ වන නියෝග සකස් කිරීම හා එම නියෝග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

(ඈ). මධ්‍යස්ථාන වල කටයුතු වලට අදාළ සියළු අංශයන්ගෙන් ඉටු විය යුතු කාර්යභාරය හඳුනාගැනීම සහ ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් සකස් කිරීම, උපදෙස් දීම, පසුවිපරම් කිරීම, අධීක්ෂණය කිරීම හා ඊට අදාළ උපදෙස් වරින් වර නිකුත් කිරීම.

(ඇ) ඌව පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි ලියාපදිංචි මධ්‍යස්ථාන වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, මධ්‍යස්ථානවල විෂයට අදාල විෂය නිර්දේශයන් නියම කිරීම, සංශෝධනය කිරීම හා ඊට අදාළ වෙනත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

(ඉ) සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන්ට තිබිය යුතු අවම අධ්‍යාපන සුදුසුකම් නියම කිරීම.

(ඊ) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් හඳුනාගෙන ඔවුන්ට ගැලපෙන සේ ඉදිරි අධ්‍යාපන වැඩ සටහන් සකස් කිරීම හා එම දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමටත් දරුවන්ගේ වර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් සකස් කිරීමටත් පියවර ගැනීම.

(උ) මෙම ප්‍රඥප්තියේ විධි විධාන වලට පටහැනිව ක්‍රියාකාරකම් සිදු කරන හා පවත්වාගෙන යන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග නිශ්චය කිරීම.

(ඌ) මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමට අදාළව ලැබෙන අභියාචනා පිළිබඳව පරීක්ෂා කර බලා නිසි බලධාරියා වෙත අවශ්‍ය උපදෙස් දීම.

(එ). මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය රීති සකස් කිරීම හා උපදෙස් නිකුත් කිරීම.

(ඒ) මුල් ළමා විය විෂය සම්බන්ධව පළාත තුළ නිශ්චිත රාජකාරි ඉටු කරනු ලබන රාජ්‍ය නිලධාරීන් ගේ විෂය වගකීම් සම්බන්ධ ක්‍රියාමාර්ග නිශ්චය කිරීම.

(ඔ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිසි බලධාරියා වෙත අවශ්‍ය විට සුදුසු උපදෙස් නිකුත් කිරීම.

17. ඌව පළාතේ සියලුම මධ්‍යස්ථාන සඳහා භාවිතා කළ යුතු විෂය මාලාවක් ජාතික අධ්‍යාපන ආයතනයේ මඟ පෙන්වීමට අනුකූලව උපදේශක කමිටුව විසින් සකස් කළ යුතු අතර, එකී විෂය මාලාව අමාත්‍යවරයා විසින් පිළිගැනීමෙන් අනතුරුව පළාතේ සියළුම මධ්‍යස්ථානවල ක්‍රියාත්මක කළ යුතුය. පොදු විෂය මාලාවක් සකස් කළ යුතු බව

## V කොටස

## මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතීන්

18. 1 මුල් ළමා විය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන අලුතින් ස්ථාපනය කිරීමේදී හා පවත්නා එවැනි මධ්‍යස්ථාන ප්‍රතිසංවිධානය කිරීම පිණිස පහත සඳහන් ප්‍රමිතීන් නියම කරනු ලැබේ. මධ්‍යස්ථාන වල තිබිය යුතු අවම පහසුකම්

(අ) මධ්‍යස්ථාන භූමි භාගය ස්වාභාවික අනතුරු වලින් සහ උපද්‍රව වලින් තොර ස්ථානයක් වීම.

(ආ) එක් දරුවෙකු සඳහා අවම වශයෙන් වර්ග අඩි දහයක ඉඩ ප්‍රමාණයක් වෙන් කර තිබීම.

(ඇ) ළමුන් විසිපහකට එක් වැසිකිළියක් බැගින් ජල මුද්‍රිත වැසිකිළි පද්ධතියක් සකස් කර තිබීම.

(ඈ) ගොඩනැගිල්ලේ බිම සිමෙන්ති හෝ එවැනි ස්ථිර ආවරණයකින් යුක්ත විය යුතු අතර කාමර වර්ග ප්‍රමාණයෙන් 1/7ක් (හතෙන් එකක්) වන පරිදි වාතාශ්‍රය සැපයෙන ආකාරයට දොර ජනෙල් වලින් සමන්විත වීම හා එහි විදුලි උපකරණ උපාංග ඉතා ආරක්ෂිත අන්දමින් සවිකර තිබීම.

(ඉ) ආරක්ෂිත තාප්පයකින් හෝ ආරක්ෂිත වැටකින් මධ්‍යස්ථාන භූමිය මැනවින් ආරක්ෂා කර තිබීම ද ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ආරක්ෂිත වැඩ පිළිවෙලක් යොදා තිබීම ද අවශ්‍ය වේ.

(ඊ) නිසි බලධාරියාගේ උපදෙස් පරිදි බෙහෙත් සහිත ප්‍රථමාධාර පෙට්ටියක් පවත්වාගෙන යාම ද එම උපකරණ හා ද්‍රව්‍ය නිසි ප්‍රමිතියෙන් හා සෞඛ්‍යාරක්ෂිතව තිබීම.

(උ) සෑම මධ්‍යස්ථානයකම ක්‍රීඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගෙමිදුලක් හෝ ළමුන්ගේ ක්‍රියාකාරකම් වර්ධනය කෙරෙන ප්‍රමාණවත් ක්‍රීඩා උපකරණ හා භාණ්ඩ තිබීම.

(ඌ) පිරිසිදු පානීය ජලය හා අනිකුත් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ජල පහසුකම් තිබීම

(එ) සෑම මධ්‍යස්ථානයකම සාමාන්‍ය ශිෂ්‍යයන් සඳහා 20:1 ( විස්සට එක) අනුපාතයට ද විශේෂිත ළමුන් සඳහා 5:1 (පහට එක) අනුපාතයට ද ගුරුවර / ගුරුවරියන් යොදා ගැනීම.

(ඒ) සෑම මධ්‍යස්ථානයකම භූමිය හෝ ගෙවත්ත ප්‍රසන්න පරිසරයකින් යුතුව සකස් කර තිබීම හා නිසි බලධාරියා විසින් නියම කරනු ලබන ආකාරයට මූලික ක්‍රීඩා පහසුකම් වලින් සමන්විත වී තිබීම.

(ඓ) ප්‍රමාණවත් පරිදි ළී බඩු උපකරණ තිබීම සහ ඒවා දරුවන්ගේ මානසික ප්‍රබෝධයට ඉවහල් වන ආකාරයට ප්‍රසන්න පෙනුමකින් පවත්වාගෙන යාම.

(ඔ) ආගමික වතාවත් කිරීමට සුදුසු ස්ථානයක් සකස් කර තිබීම.

(2) හානිකර හෝ අන්තරාදායක පරිසරයක් තුළ හෝ හානිකර හෝ අන්තරාදායක පරිසරයක් ඇති ස්ථානයක සිට මීටර් සියයක් ඇතුළත ප්‍රදේශය තුළ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම නොකළ යුතුය.

ප්‍රඥප්තිය බලාත්මක වීමට පෙර පිහිටවූ මධ්‍යස්ථාන වල ප්‍රමිතීන්

19. මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනය වන විට පළාත තුළ ක්‍රියාත්මක වෙමින් පවතින සෑම මධ්‍යස්ථානයක්ම මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට වසරක කාලයක් ගතවීමට පෙර ඉහත 18 වගන්තියේ සඳහන් ප්‍රමිතීන් අනුව පවත්වාගෙන යාමට එම මධ්‍යස්ථාන හිමිකරුවන් , පාලකයන් ක්‍රියාකළ යුතුය.

මධ්‍යස්ථාන පිළිබඳ රීති සකස් කිරීම

20. මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යනු ලබන හෝ මධ්‍යස්ථානයක් පැවැත්වීමට බලාපොරොත්තු වන පරිශ්‍රයක පවත්වා ගෙන යා යුතු පහසුකම් වල ප්‍රමිතිය පිළිබඳව රීති මඟින් නියම කරනු ලැබිය යුතු යි.

## VI කොටස

### මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම

21. මෙම ප්‍රඥප්තිය බලාත්මක වීමෙන් පසු, මෙතෙක් කවර හෝ ආකාරයෙන් ඌව පළාත තුළ පවත්වා ගෙන යන්නා වූ මධ්‍යස්ථාන විසින් කරන ලද ලියාපදිංචි කිරීම් සියල්ල අවලංගු වූ ලෙස සැළකෙන අතර, එකී සෑම මධ්‍යස්ථානයක්ම අධිකාරිය යටතේ නැවත ලියාපදිංචි වීම සඳහා ඉල්ලා සිටිය යුතු ය. සියලු මධ්‍යස්ථාන නැවත ලියා පදිංචි විය යුතු බව

22. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින පටන් හා ඉන් පසුව මෙම ප්‍රඥප්තිය නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ සහ එහි නියම හා කොන්දේසි වලට අනුකූලව හැර කිසියම් තැනැත්තකු විසින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හෝ පෙර පාසැලක් හෝ අවුරුදු පහට අඩු දරුවන්ගේ කායික හෝ මානසික සංවර්ධනය හෝ සුරක්ෂිතභාවය සඳහා පවත්වා ගෙන යනු ලබන කිසියම් මධ්‍යස්ථානයක් හෝ පවත්වාගෙන යෑම හෝ පිහිටුවීම නොකළ යුත්තේය.

23. මෙම ප්‍රඥප්තිය ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ මාස තුනක් ඉකුත්වීමට පෙර ඒ වන විට පළාත තුළ පවත්වාගෙන යනු ලබන සෑම මධ්‍යස්ථානයකම අයිතිකරු හෝ කළමණාකරු හෝ පාලක එකී මධ්‍යස්ථානය ලියාපදිංචි කරන ලෙස නිසි බලධරයා වෙත ඉල්ලුම් කළ යුතුය. මාස තුනක් තුළ ඉල්ලුම් කළ යුතු බව

24. මෙම ප්‍රඥප්තිය ගැසට් කිරීම මඟින් ප්‍රකාශයට පත්කළ පසු එසේ මාස තුනක් ඇතුළත ඉහත 21 වගන්තිය පරිදි ඉල්ලුම් කිරීමට අපොහොසත් වූ කිසියම් අයිතිකරුවකු හෝ කළමණාකරුවකු හෝ පාලකයෙකු හෝ යුක්ති සහගත හා සාධාරණ යැයි බැලූ බැල්මට පෙනෙන හේතු සහිතව ඉල්ලීමක් කරනු ලැබූ විට ඉකුත් වූ කාලය සැළකිල්ලට ගෙන නිසි බලධරයා විසින් කිසියම් අමතර ගාස්තුවක් අයකර ලියාපදිංචි කළ හැකිය. ප්‍රමාද වී ඉල්ලුම් කිරීම

25. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් පසු අළුතින් ආරම්භ කරනු ලබන මධ්‍යස්ථාන ද ආරම්භ කිරීමට පෙර නිසි බලධරයා වෙත ඉල්ලීමක් කර ලියාපදිංචි කළ යුතු ය. නව මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම

26. (1). ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම්කරු නිසි බලධාරියා විසින් නියම කරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.

(2). ලියාපදිංචි කිරීමට අවශ්‍ය සුදුසුකම් හා අනෙකුත් අවශ්‍යතා, අදාල ආකෘති හා ගාස්තු නිසි බලධාරියා විසින් කලින් කලට ප්‍රකාශයට පත් කළ යුතුය.

(3) මුල් ළමා විය සංවර්ධනය සඳහා පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් මෙහෙයවනු ලබන පළාත තුළ ඇති ඕනෑම පෞද්ගලික ආයතනයක් රීති වලින් නියම කර ඇති ආකාරයට නිසි බලධරයා වෙත ලියාපදිංචි විය යුතු ය.

(4). ලියාපදිංචි වීමේ කාලය දීර්ඝ කිරීම සඳහාද ලියාපදිංචි කිරීමට ප්‍රමාද වන කාලය සඳහාද අතිරේක ගාස්තුවක් හෝ දඩ මුදලක් අයකිරීමට ද නිසි බලධාරියාට බලය ඇත්තේය.

27. (1). පළාත තුළ වයස අවුරුදු පහට අඩු දරුවන් සඳහා කිනම් හෝ ආකාරයක අධ්‍යාපන කටයුත්තක් ඉටුකිරීමේ අරමුණු ඇතිව, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින වන විට පවත්වාගෙන යන සෑම ආයතනයක්ම මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ලෙස සැලකේ.

(2) සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන විශේෂ ළමුන් සඳහා වන වයස අවුරුදු පහට අඩු කාණ්ඩ වල දරුවන්ගේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ද මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි විය යුතුය.

28. නිසි බලධාරියා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම හා ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් සලකා බැලීමෙන් පසු

(අ) මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සුදුසුකම් ඉල්លුම්කරු සතුව ඇති බවට සහ

(ආ) මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යනු ලබන හෝ පැවැත්වීමට බලාපොරොත්තු වන පරිශ්‍රය 18 වගන්තිය යටතේ නියම කරනු ලබන පහසුකම් වල ප්‍රමිතියට අනුකූල බවට සෑහීමකට පත්වන්නේ නම් පමණක් ඔහු විසින් ඉල්ලුම්කරු ලියාපදිංචි කරනු ලැබිය හැකි යි.

29. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන කඩ කරමින් යම් මධ්‍යස්ථානයක් ආරම්භ කරන හෝ යම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, එම වරද කරන සෑම මාසයක්ටම රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේය. කෙසේ වුවද එම තැනැත්තා එම වරද දිගින් දිගටම කරන්නේ නම් මාස හයක් ගත වීමට මත්තෙන් ප්‍රඥප්තියේ IX වන කොටසේ වැරදි හා දණ්ඩන යටතේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

30. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ පෙර පාසලක් හෝ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් නමින් පවත්වාගෙන යනු ලබන කිසියම් ආයතනයක් ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි නිසි බලධාරියා වෙත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබුවිට එම ඉල්ලීම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූල නොවේ නම් නිසි බලධාරියා විසින් ඒ පිළිබඳව හේතු දක්වා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම

(1). එවැනි ප්‍රතික්ෂේප කිරීමක් කරනු ලැබූ සෑම අවස්ථාවකම එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත ඉල්ලීම කරනු ලැබූ මධ්‍යස්ථානයේ අයිතිකරුට හෝ කළමණාකරුට හෝ ඉල්ලුම්කරුට දන්වා යැවිය යුතුය.

(2). එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදුවූ අවස්ථාවක එකී මධ්‍යස්ථානයේ අයිතිකරු හෝ කළමණාකරු විසින් ඒ සම්බන්ධයෙන් ලේකම්වරයා වෙත දින දහයක් ඇතුළත අභියාචනාවක් කළ හැකිය.

(3). එවැනි අභියාචනයක් ලැබූ විට ලේකම්වරයා විසින් උපදේශක කමිටුව වෙත එය යොමුකොට උපදේශක කමිටුවේ නිරීක්ෂණය හා නිර්දේශය ලබා ගනිමින් එකී අභියාචනය සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුය.

(4). මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් උපදේශක කමිටුව විසින් ගනු ලබන තීරණය අවසානාත්මක වන්නේය.

31. (1). නිසිබලධරයා විසින් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට මධ්‍යස්ථාන වශයෙන් පවත්වාගෙන ගොස් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කරන ලද්දා වූ සහ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුව ලියාපදිංචි කර අලුතින් ආරම්භ කරන ලද්දා වූ මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ ලේඛනයක්, එකී මධ්‍යස්ථාන වල නම් හා ලිපිනයන්ද , එම මධ්‍යස්ථාන පවත්වාගෙන යන තැනැත්තන්ගේ නම් හා ලිපිනයන් ද, තවත් අවශ්‍ය යැයි නිසි බලධරයා විසින් තීරණය කරනු ලබන තොරතුරු ද සහිතව පවත්වාගෙන යා යුතුය.

ලියාපදිංචි කිරීමේ ලේඛනය හා ලියාපදිංචි කිරීමේ සහතිකය හා අංකය

(2). නිසි ප්‍රමිතියෙන් යුත් සෑම මධ්‍යස්ථානයක්ම නිසි බලධරයා විසින් ලියාපදිංචි කළ යුතු අතර, ඒ සඳහා අංකයක් සහිත ලියාපදිංචි සහතිකයක් ලබා දිය යුතු වේ. එය මධ්‍යස්ථානය පවත්වා ගෙන යනු

ලබන හෝ පැවැත්විමට බලාපොරොත්තු වන ස්ථානයේ සෑම අවස්ථාවකම ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු යි.

(3). එකී සහතිකය මේ පනතේ කාර්යයන් සඳහා වලංගු නිත්‍යානුකූල ලියවිල්ලක් ලෙස සැලකිය යුතුය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය වෙනත් යම් තැනැත්තෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශුන්‍ය හා බල රහිත වන්නේ ය.

## VII කොටස

### මධ්‍යස්ථාන වල සම්පත්දායකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් හා පුහුණු කිරීම

32. (1) මධ්‍යස්ථානයක සේවය කිරීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් ඔහු හෝ ඇය සතුව ඇත්නම් මිස යම් තැනැත්තෙකු එකී සේවය සඳහා පත් කිරීමට සුදුස්සෙකු නොවිය යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට මධ්‍යස්ථාන වල දරුවන්ගේ දැනුම , කුසලතා, ආකල්ප, බුද්ධි වර්ධනය කිරීමේ කාර්යයේ නියුතු මෙහි මින් මතු " සම්පත්දායකයින් " ලෙස හඳුන්වනු ලබන ගුරුවර/ ගුරුවරියන් , උපදේශක/ උපදේශිකාවන්, පාලක/ පාලිකාවන් , සහායක/ සහායිකාවන් ඇතුළු එකී කාර්යයෙහි නියුතු ඕනෑම තැනැත්තෙකු අවම වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ මව් භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින්වත් සමත්වීම හා උපදේශක කමිටුව විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් පවත්වන ලද මුල් ළමා විය සංවර්ධන අධ්‍යාපනය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුයි.

සම්පත්දායකයින් සඳහා වන අධ්‍යාපන සුදුසුකම්

(3) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ආරම්භ වන මධ්‍යස්ථානවල සේවයේ නියුතු සම්පත්දායකයින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ.පො.ස (උ.පෙළ) විභාගයේ විෂයන් තුනකින් සමත්ව තිබිය යුතුය.

33. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වනවිට පවත්වා ගෙන යන ලද මධ්‍යස්ථාන වල සේවයේ නියුතු සම්පත්දායකයින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති නම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වසර දෙකක් ඇතුළත එකී විභාග සමත්වීම හා නිසි බලධාරියා විසින් නියමකරනු ලබන පිළිගත් ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ අධ්‍යයන පාඨමාලාවක් ද හදාරා සමත්විය යුතුය.

සුදුසුකම් සපුරා ගැනීම සඳහා කල්දීම

34. ඉහත සඳහන් පරිදි මූලික අධ්‍යාපන සුදුසුකම් වලින් තොර වූද නිසිබලධාරියා විසින් නියම කරනු ලබන කාලය තුළ මූලික අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට අපොහොසත් වන්නා වූද සම්පත්දායකයින් වශයෙන් කටයුතු කරන නැතැත්තන්ට එකී කටයුතු වලින් ඉවත්වන ලෙස නියෝග කිරීමට නිසි බලධරයාට බලය ඇත්තේය. එවැනි නියෝගයක් ලද කිසියම් සම්පත්දායකයකු එම නියෝගය කඩ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ සිදු කරන වරදකි.

නුසුදුස්සන් ඉවත් කිරීම

35. මුල් ළමාවිය දරුවන්ගේ කායික හා මානසික වර්ධනයට සරිලන ලෙස සේවයේ යෙදීමට අපොහොසත් වීම මත හෝ වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත එකී සම්පත්දායකයාට සේවයෙන් ඉවත් වන ලෙස හෝ විශ්‍රාම ගන්නා ලෙස උපදේශක කමිටුවට නියම කළ හැකිය.

36. (1). මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වනවිට කිසියම් මධ්‍යස්ථානයක සම්පත්දායක කටයුතු වල නිරත වී සිටින සියළුම නැතැත්තන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයක් ඇතුළත නිසි බලධරයා වෙත ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම

(2). එසේ ඉල්ලුම් කරනු ලබන සම්පත්දායකයින් ලෙස ක්‍රියාකරන නැතැත්තෙකු ප්‍රඥප්තියේ විධිවිධාන අනුව සුදුසුකම් සපුරා ඇත්නම් නිසි බලධාරියා විසින් ඒ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ලේඛනයක එම නැතැත්තාගේ තොරතුරු ලියාපදිංචි කළ යුතු අතර, ඒ සමඟම එම නැතැත්තා සම්පත්දායකයෙකු බව තහවුරු කෙරෙන හැඳුනුම් පත්‍රයක් ද නිකුත් කළ යුතුය.

(3). නිසි බලධාරියා වෙත ලියාපදිංචි නොවුණු කිසිම නැතැත්තෙකු කිසිම මධ්‍යස්ථානයක සම්පත්දායකයෙකු ලෙස කටයුතු නොකළ යුතු අතර, මෙම වගන්තියට පටහැනිව කටයුතු කරන්නෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන්නෙකු වන්නේය.

ලියාපදිංචි නොවුණු කිසිම නැතැත්තෙකු සම්පත්දායකයෙකු ලෙස කටයුතු නොකළ යුතු බව

37. මුල් ළමා විය සංවර්ධන කාර්යයේ නිරත සම්පත්දායකයින් පුහුණු කිරීම්වල යෙදෙන ඌව පළාත තුළ පිහිටි සෑම පුහුණු කිරීමේ ආයතනයක්ම (ජාතික

මට්ටමේ රාජ්‍ය ආයතන හැර) නිසි බලධරයා වෙත ලියාපදිංචි කළ යුතු අතර, ඒ සඳහා නිසි බලධරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතුය. එවැනි ලියාපදිංචි සහතිකයක් ලබා නොගෙන එවැනි ආයතනයක් පවත්වා ගෙන යාම මෙම ප්‍රඥප්තිය යටතේ වරදකි.

පුහුණු කිරීමේ ආයතනය ලියාපදිංචි කළ යුතු බව

38. මධ්‍යස්ථානවල සම්පත්දායකයින් පුහුණු කිරීමට අදාළව විධිමත් වැඩ පිළිවෙළක් නිසි බලධාරියා විසින් සෑම වසරකම සකස්කර අනුමැතිය සඳහා උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

පුහුණුවලට සහභාගී නොවන්නන් ඉවත් කිරීමට ඇති බලය

39. උපදේශක කමිටුව විසින් මෙහෙයවනු ලබන පුහුණු වීම්වලට සහභාගී නොවන සම්පත්දායකයින් හට මධ්‍යස්ථානවල සේවයේ යෙදීමෙන් වළකින ලෙස නියෝග කිරීමට නිසි බලධාරියාට බලය ඇත. එවැනි නියෝගයක් ලද සම්පත්දායකයින් තවදුරටත් සේවයේ යෙදීම හෝ සේවයේ යොදවා ගැනීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

පුහුණුව අනිවාර්ය බව

40. මධ්‍යස්ථානවල සම්පත්දායකයින් උපදේශක කමිටුව විසින් නියම කරන ලද කාල වකවානුවට අනුව නියමිත පුහුණු පාඨමාලා අඛණ්ඩව හැදෑරිය යුතුය.

දෙමව්පියන් දැනුවත් කළ යුතු බව

41. මධ්‍යස්ථානවල දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා උපදේශක කමිටුවේ ද උපදෙස් පරිදි විධිමත් සැලැස්මක් නිසි බලධාරියා විසින් සකස් කර, ක්‍රියාත්මක කළ යුතුය.

## VIII කොටස

## පොදු විධි විධාන

අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව

42. (1). නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්තිය මඟින් නියමිත හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය මඟින් බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලු කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති හෝ නියෝග සෑදිය හැකිය.

(2). අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම හෝ නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3). අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම හෝ නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභා වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනුමත දිනයේ සිට එකී රීතිය හෝ නියෝග යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන්

හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4). යම් රීතියක් හෝ නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පලකළ යුතුය.

(5). ඉහත (1) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති හෝ නියෝග පළාත් සභාවේ සම්මත වීමෙන් පසුව ඒවා මෙම ප්‍රඥප්තිය මගින් පැනවූවාක් මෙන් බලාත්මක විය යුතුය.

43. අධිකාරියේ නිලධාරීන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

44. අධිකාරිය අල්ලස් පනත යටතේ අර්ථානුකූලව උපලේඛන ගත අධිකාරියක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන යටතේ කටයුතු කළ යුතුය.

45. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා අදහස් කරන කවර හෝ පුද්ගලයෙකුගේ සේවය යම් නියමිත කාල සීමාවකට ලබා ගත හැකි අතර, ආණ්ඩුකාරවරයා නියම කරනු ලබන දීමනාවක් ඒ සඳහා ඔහුට හෝ ඇයට ගෙවිය හැකිය.

මධ්‍යස්ථාන වලට වාර්ෂිකව දීමනාවක් ලබා දිය හැකි බව

46. උපදේශක කමිටුවේ අනුමැතිය මත , නිසි බලධාරියා විසින් වාර්ෂිකව යම් දීමනාවක් ලියාපදිංචි මධ්‍යස්ථානවලට ලබා දිය හැකිය.

47. ආණ්ඩුකාරවරයා විසින් හෝ අමාත්‍යවරයා විසින් හෝ උපදේශක කමිටුව විසින් හෝ ලේකම්වරයා විසින් හෝ නිසි බලධාරියාට යම් නියෝගයක්, උපදෙසක්, මඟ පෙන්වීමක් කළහොත් ඒ අනුව කටයුතු කිරීමටද යම් වාර්තාවක් හෝ ලේඛනයක් ඉල්ලා සිටියහොත් එය ලබා දීමට ද නිසි බලධාරියා විසින් කටයුතු කළ යුතුය.

## IX කොටස

### වැරදි හා දණ්ඩන

විධිවිධාන උල්ලංඝනය කිරීම හා රාජකාරියට බාධා කිරීම.

48. මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සම්පාදනය කරන ලද රීති හෝ නියෝග හෝ විධිවිධාන හෝ උල්ලංඝනය කිරීම, කඩ කිරීම හෝ එම විධි විධාන අනුව ක්‍රියාකිරීමේ බලය ඇති අයෙකුට තම රාජකාරී කටයුතු ඉටු කිරීමට බාධා කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

49. ඉහත 48 වගන්තියේ සඳහන් වරදක් සිදු කරන සෑම තැනැත්තෙකුටම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරද කරුවකු කරනු ලැබුවහොත් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහදාහක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ එම දඩුවම් දෙකටම හෝ යටත් විය යුතුය. වරදකරුවන්නන්ට නියමිත දඬුවම්

50. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා හෝ මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද රීතිවල සඳහන් යම් විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේදී හෝ කිසියම් අධිකරණයක් ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීමට හෝ සාක්ෂි දීමට නිසි බලධාරියාට හෝ ඔහු විසින් ලිඛිතව බලය පැවරූ නිලධාරියෙකුට හැකි විය යුතුය. අධිකරණ කටයුතු

51. මෙම ප්‍රඥප්තියේ සඳහන් යම් කාර්යයක් ඉටු කරන්නේ හෝ ඒ සඳහා පත්කරනු ලබන්නේ හෝ නම් කරනු ලබන්නේ යම් තැනැත්තෙක්ද එම තැනැත්තා හෝ තැන්තන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයින් ලෙස සැලකිය යුතුය.

52. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමත් සමඟ ඌව පළාතේ 2011 අංක 05 දරණ මුල් ළමාවිය ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පරිච්ඡින්න විය යුතුය.

53. අර්ථ නිරූපන

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි, **"පළාත"** යනුවෙන් , මොණරාගල සහ බදුල්ල යන පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 8 වන උප ලේඛනයේ සඳහන් ඌව පළාත ද,

**"ආණ්ඩුකාරවරයා"** යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා ද ,

**"පළාත් සභාව"** යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ xvii අ පරිච්ඡේදයේ 154 අ (1) ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ඌව පළාතේ පළාත් සභාවද,

**"නිසි බලධාරියා"** යන්නෙන් මෙම ප්‍රඥප්තියේ නිසි බලධාරියා වශයෙන් විධිමත්ව පත්කර ඇති නිලධාරියාද ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට නිසි පරිදි බලයලත් නිලධාරියාද,

**"පළාත් සභා රාජ්‍ය සේවය"** යන්නෙන් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති පළාත් සභා රාජ්‍ය සේවයද,

**"මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන"** යන්නෙන් වයස අවුරුදු පහට අඩු දරුවන් සඳහා රැකවරණය හා අධ්‍යාපනය ලබා දෙන දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල්, පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන ඇතුළු එම

දරුවන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය හා සුරක්ෂිතභාවය සඳහා පළාත තුළ පිහිටුවා ඇති සියලුම මධ්‍යස්ථාන ද ,

**"කළමණාකරුවන්"** යනුවෙන් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන ව්‍යවසායකයන්ද, හිමිකරුවන්ද, පාලකයන්ද,

**"විශේෂ ළමුන්"** යනුවෙන් මධ්‍යස්ථාන වලට යා යුතු වයසේ සිටින පෙනීම දුබලවීම, ඇසීම දුබලවීම, කායික ආබාධිත තත්වයන් හා සෙමෙන් මනස වැඩෙන දරුවන් ආදී විශේෂිත ළමුන්ද,

**"මධ්‍යස්ථාන පවත්වාගෙන යන තැනැත්තෙකු"** යනුවෙන් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන පුද්ගලයෙකු , ව්‍යවසායකයෙකු හෝ ස්වෙච්ඡා සංවිධානයක් හෝ සංස්ථාගත ආයතනයක් ද,

**"නියමිත දිනය"** යනුවෙන් මෙම ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය ද අදහස් වේ

54. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එහි සිංහල පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්වෙන බව